රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන
தொலைபேசி:**(94) 011- 2694560**
Telephone

ෆැක්ස්
தொலைநகல்:**(94) 011- 2692254**
Fax

ඊ-මේල්
மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk**
E-mail

වෙබ් අඩවිය
இணையத்தளம்: **www.pubad.gov.lk**
Web Site

---

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/ICTS/01/MSO-06/පොදු | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2024.05.20 |

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**විදේශ කටයුතු අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ නිලධාරින්ගේ පුරප්පාඩු පිරවීම**

විදේශ කටයුතු අමාත්‍යාංශයේ පුරප්පාඩු ලෙස පවතින ඒකාබද්ධ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු සඳහා සේවා අවශ්‍යතාව මත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ සඳහා කැමැත්තක් දක්වන ඒකාබද්ධ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරින් තම ජීව දත්ත පත්‍රිකාව හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වන ලේඛනවල සහතික කළ පිටපත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව PDF Document ආකාරයෙන් 2024.05.31 දිනට පෙර විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. තොරතුරු එවීමේ දී පහත කරුණු විශේෂයෙන් සැලකිල්ලට ගන්න.

(i) ජීව දත්ත පත්‍රිකාවේ පැහැදිලිව නම, ජාතික හැඳුනුම්පත් අංකය, සක්‍රීය දුරකතන අංකය සඳහන් කළ යුතු ය.

(ii) මේ සඳහා අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III/II/I ශ්‍රේණිවලට අයත් MT – 1 – 2016 යටතේ වැටුප් ලබන නිලධාරින්ට පමණි.

(iii) පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව 02කි.

(iv) මෙහිදී ජාල පරිපාලනය, දෘඪාංග දෝෂ නිරාකරණය, මෘදුකාංග/ වෙබ් අඩවි සංවර්ධනය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති නිලධාරින් තෝරා ගැනීමට වැඩි අවධානයක් යොමු කරන අතර ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ද සලකා බලනු ලැබේ.

(v) PDF ස්වරූපයෙන් සැකසූ අයදුම්පත යොමු කළ යුතු e-mail ලිපිනය admin.reports@mfa.gov.lk

(vi) තොරතුරු විමසිය හැකි දුරකථන අංකය 011-2324119 - දේශිකා ජයතිලක මෙය (පාලන අංශය)

04. විදේශ කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර සඳහා ප්‍රියමනාප සේවා ස්ථානයක් බැවින් ප්‍රියමනාප / ප්‍රතිලාභ සහිත සේවා ස්ථානවල සේවය කරන / සේවය කළ නිලධාරින් මේ සඳහා අයදුම් කිරීමෙන් වැලකී සිටින ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්